(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 427.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2015 ජනවාරි මස 29 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට

## ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතුය. අ. භා. 6.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— ස්ථාවර නියෝග අංක 7(1) හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, 2015 ජනවාරි මස 30 වැනි සිකුරාදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2015 ජනවාරි මස 30 වැනි සිකුරාදා අ. භා. 1.30 වන තෙක් කල් තැබිය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 194 /'13

1.

ගරු රාජීව විජේසිංහ මහතා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය,— ස්ථාවර නියෝග අංක 134 ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල පහත සඳහන් සංශෝධන ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවට යොමුකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

1.

අංක 32 (2) ස්ථාවර නියෝගයට ඉක්බිතිවම පහත කොටස ඇතුළත් කරන්න:—

"(3) න්‍යාය පත්‍රයේ සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු දීම අදාළ අමාත්‍යවරයා විසින් සිදු කරනු ලැබිය යුතුය. නියමිත දිනයේදී පිළිතුරු ලබාදිය නොහැකි නම්, මාසයක කාලයක් සඳහා කල් ලබා දෙන ලෙස අමාත්‍යවරයාට ඉල්ලා සිටිය හැකිය. ප්‍රශ්නය මතු කරනු ලබන දෙවැනි අවස්ථාවේදී ද පිළිතුරක් නොලැබේ නම්, කථානායකවරයා ප්‍රශ්නය පිළිබඳ තොරතුරු අදාළ විධායකයේ අංශ ප්‍රධානියා වෙත ලිඛිතව දන්වා, එම ලිපිය ලද දිනයේ සිට සති දෙකක් ඇතුළත පිළිතුරු ලබා දෙන ලෙස ඉල්ලා සිටිය යුතුය."

2.

අංක 45 ස්ථාවර නියෝගය, අංක 45(1) ස්ථාවර නියෝගය වශයෙන් නැවත අංකගත කර (1) ඡේදයේ "දිනයක" යන වචනයට ඉක්බිතිවම "එය ඉදිරිපත් කරනු ලබන දිනයට දින දෙකකට නොඅඩු කාලයකට පෙර නොවන දිනයක" යන වචන ඇතුළත් කරන්න.

අංක 45(1) ස්ථාවර නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:—

"(2) සෑම පනත් කෙටුම්පතකම එහි නෛතික බලපෑමේ ප්‍රකාශයක් ඇතුළත් විය යුතුය:

එතෙකුදු වුවත්, කිසිදු පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ කටයුතු සිදුකරනු ලබන භාෂාත්‍රයෙන්ම මන්ත්‍රීන්ට ලබා නොදී සලකා බැලීම සඳහා සාකච්ඡාවට ගනු නොලැබිය යුතුය. එසේ ලබා දෙන බවට වග බලා ගැනීම පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ වගකීම විය යුතු අතර, පනත් කෙටුම්පත සාකච්ඡාවට ගැනීමට පෙර මහ ලේකම්වරයා විසින් කථානායකවරයා වෙත ඒ බව වාර්තා කරනු ලැබිය යුතුය."

අංක 45(2) ස්ථාවර නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:—

"(3) පනත්කෙටුම්පතක් (විසර්ජන පනත් කෙටුම්පත නොවූ) පළමුවැනි වර කියවීමෙන් අනතුරුව නිශ්චිත කාල සීමාවක දී වාර්තාකිරීම පිණිස අදාළ උපදේශක කාරක සභාවට යොමු කරනු ලැබිය යුතුය."

3.

අංක 53 ස්ථාවර නියෝගය අගට පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:—

"කාරක සභාවේදී සලකා බැලීම සඳහා යටත් පිරිසෙයින් දින දෙකක් වත් ලබා දෙන්නේ නම්, නියමිත දිනයකදී වාර්තා කරනු පිණිස කාරක සභාවට නියම කරනු ලැබිය හැකිය. එසේ සලකා බැලීමෙන් පසුව පමණක් පනත් කෙටුම්පත තුන්වැනි වර කියවීම සිදු කළ යුතුය.".

4.

අංක 78අ (2) ස්ථාවර නියෝගය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:—

"(2) මෙම නියෝගයේ (1) ඡේදයේ දක්වා ඇති යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබූ විට, එම යෝජනා සම්මතයේ දක්වා ඇති විෂම පැවැත්ම හෝ අබලතාව පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා එහි ප්‍රතිඵල පාර්ලිමේන්තුවට වාර්තා කරනු පිණිස ගණපූරණය මන්ත්‍රීන් තිදෙනෙකුගෙන් සමන්විත හත් දෙනෙකුට නොඅඩු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවකගෙන් යුතු පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් කථානායකවරයා විසින් පත්කරනු ලැබිය යුතුය. එවැනි විමර්ශනයක් සිදු කරනු ලැබිය යුත්තේ විශ්‍රාමික විනිශ්චයකාරවරයෙකු හෝ එක් අයෙකුට වැඩි විශ්‍රාමික විනිශ්චයකාරවරුන්ගෙන් සමන්විත විනිශ්චයාධිකාරයක් විසිනි. එම විනිශ්චයාධිකාරය ඉදිරියේ නඩුව ඉදිරිපත් කිරීම හා සාක්ෂි මෙහෙයවීම සඳහා යම් තැනැත්තෙකු විශේෂ කාරක සභාව විසින් පත් කරනු ලැබිය හැකිය."

(3) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:—

"(3) එවැනි විනිශ්චයාධිකාරයක් කාරක සභාව විසින් පවත්වනු ලබන විමර්ශනයට භාජනය වූ චෝදිත විෂම පැවැත්මට හෝ අබලතාවට අදාළ විනිශ්චයකාරවරයා වෙත එම විශේෂ කාරක සභාව පත් කිරීමට අදාළ යෝජනා සම්මතයේ දක්වා ඇති, එකී විනිශ්චයකාරවරයාට එරෙහිව එල්ල

කරනු ලැබ ඇති විෂම පැවැත්ම හෝ අබලතාව පිළිබඳ චෝදනාවල පිටපතක් ලබා දිය යුතු අතර, එමගින් නියම කරනු ලබන කාලයක් ඇතුළත ඔහුගේ විත්තිවාචකය පිළිබඳ ලිඛිත ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස නියම කළ යුතුය.”

(4) හා (5) ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:—

“(4) මෙම විනිශ්චයාධිකාරයට පුද්ගලයින්, ලිපිලේඛන සහ වාර්තා කැඳවීමටත්, අදාළ විමර්ශනයේ ප්‍රස්තුතය වූ චෝදිත විෂම පැවැත්ම හෝ අබලතාවට අදාළ විනිශ්චයකාරවරයාට පුද්ගලිකවම හෝ නියෝජිතයෙකු මගින් ඒ ඉදිරියේ පෙනී සිටීමට හා ඔහුට එරෙහි නඩුව ඉදිරිපත් කිරීමෙන් හා එම නඩුව ඔප්පු කරනු පිණිස සාක්ෂ්‍යකරුවන්ගේ සාක්ෂ්‍ය ඉදිරිපත් කිරීමෙන් පසුව, විනිශ්චයාධිකාරය ඉදිරියේ දී කරුණු ඉදිරිපත් කිරීමට හා අදාළ චෝදනා නිෂ්ප්‍රභ කරනු පිණිස වාචික හෝ ලේඛනමය සාක්ෂ්‍ය ඉදිරිපත් කිරීමට ඉඩ සැලසීමටත් බලය තිබිය යුතුය.”

(6) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත කොටස ආදේශ කරන්න:—

“(5) විමර්ශනය සමාප්ත වූ විට එම විනිශ්චයාධිකාරය සිය සොයා ගැනීම් විශේෂ කාරක සභාව වෙත වාර්තා කළ යුතු අතර, විශේෂ කාරක සභාව එම සොයා ගැනීම් පිළිබඳව සාකච්ඡාවට භාජනය කොට, ඉදිරිපත් වූ සාක්ෂ්‍යවල කාර්යසටහන්ද සමගින්, සිය නිර්දේශයන්ද සහිත වාර්තාවක් එහි කාර්ය සැසි ආරම්භවීමෙන් මාසයක කාලයක් ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු අතර, පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කිරීමට සුදුසුයැයි තමන් සිතන යම් කාරණා සම්බන්ධයෙන් වූ විශේෂ වාර්තාවක් ඉදිරිපත් කිරීමටද එම කාරක සභාවට හැකිය.

එසේකුදු වුවත්, මෙහි සඳහන් කාල සීමාව ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට විශේෂ කාරක සභාවට නොහැකි වේ නම්, තවදුරටත් විශේෂිත කාල සීමාවක් සඳහා හේතු දක්වමින් එසේ කාලය දීර්ඝ කරන ලෙස පාර්ලිමේන්තුවේ අවසරය ඉල්ලා සිටිය යුතු අතර, අවශ්‍ය යැයි හැඟී යන පරිද්දෙන් එවැනි කාලය දීර්ඝ කිරීමක් ලබා දීමට පාර්ලිමේන්තුවට හැකි වන්නේය.”

(7) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:—

“(6) විනිශ්චයාධිකාරයේ වාර්තාව සහ විශේෂ කාරක සභාවේ නිර්දේශය සලකා බැලීමෙන් පසුව, ඔප්පු කරන ලද විෂම පැවැත්ම හෝ අබලතාව හේතුවෙන් විනිශ්චයකාරවරයෙකු ඉවත් කිරීම සඳහා ජනාධිපතිවරයා වෙත කෙරෙන ඇමතීමක් සඳහා වූ අදාළ යෝජනා සම්මතය පිළිබඳව ඡන්දය ප්‍රකාශ කිරීමට පාර්ලිමේන්තුවට හැකි වන අතර එම යෝජනා සම්මතය පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබුවහොත්, එම ඇමතීම, පාර්ලිමේන්තුව වෙනුවෙන් කථානායකවරයා විසින් ජනාධිපතිවරයාට ඉදිරිපත් කරනු ලැබිය යුතුය.”.

5.

අංක 78ආ (2) ස්ථාවර නියෝගය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:—

“(2) මෙම නියෝගයේ (1) ඡේදයේ දක්වා ඇති යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබූ විට, එම යෝජනා සම්මතයේ දක්වා ඇති විෂම පැවැත්ම හෝ අබලතාව පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් විමර්ශනයක් ක්‍රියාත්මක කොට එහි ප්‍රතිඵල පාර්ලිමේන්තුවට වාර්තා කරනු පිණිස ගණපූරණය මන්ත්‍රීන් තිදෙනෙකුගෙන් සමන්විත හත්

දෙනෙකුට නොඅඩු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවකගෙන් යුතු විශේෂ කාරක සභාවක් කථානායකවරයා විසින් පත් කරනු ලැබිය යුතුය. එවැනි විමර්ශනයක් සිදු කරනු ලැබිය යුත්තේ විශ්‍රාමික විනිශ්චයකාරවරයෙකු හෝ එක් අයෙකුට වැඩි විනිශ්චයකාරවරුන්ගෙන් සමන්විත විනිශ්චයාධිකාරයක් විසිනි. එම විනිශ්චයාධිකාරය ඉදිරියේ නඩුව හා සාක්ෂි ඉදිරිපත් කිරීම සඳහා යම් තැනැත්තෙකු විශේෂ කාරක සභාව විසින් පත් කරනු ලැබිය හැකිය.''

(3) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:—

"(3) එවැනි විනිශ්චයාධිකාරයක් විසින් සිය විමර්ශනයට යොමු කරනු ලැබ ඇති විෂම පැවැත්ම හෝ අබලතාව පිළිබඳ චෝදනාවලට ලක්වූ, මෙම නියෝගයේ (1) ඡේදයේ සඳහන් තැනැත්තා වෙත එම තැනැත්තාට විරුද්ධව එල්ල කර ඇත්තාවූත්, එම විශේෂ කාරක සභාව පත් කරනු ලැබීමට මුල් වූ යෝජනා සම්මතයේ දක්වා ඇත්තාවූත්, විෂම පැවැත්ම හෝ අබලතාව හෝ පිළිබඳ චෝදනාවල පිටපතක් යවා විශේෂ කාරක සභාව විසින් නියම කරනු ලබන කාලපරිච්ඡේදයක් ඇතුළත ඔහුගේ විත්තිවාචකය පිළිබඳ ලිඛිත ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස එම තැනැත්තාට නියම කළ යුතුය.''

(4) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:—

"(4) මෙම විනිශ්චයාධිකාරයේ විමර්ශනයට විෂයය වූ විෂම පැවැත්ම හෝ අබලතාව හෝ පිළිබඳව චෝදනාවලට ලක් වූ (1) ඡේදයේ සඳහන් තැනැත්තාට එකී විනිශ්චයාධිකාරය ඉදිරියේ පුද්ගලිකවම හෝ නියෝජිතයෙකු මගින් හෝ පෙනී සිටීමට ද, කරුණු කියා සිටීමට ද, තමන්ට එරෙහිව නගා ඇති නඩුවේ ආරම්භය සහ එම නඩුව තහවුරු කිරීමට ඇති සාක්ෂිකරුවන්ගේ සාක්ෂි අනුව ඔහුට විරුද්ධව නගා ඇති චෝදනා විසාධනය කිරීම සඳහා වාචික හෝ ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කිරීමට එම තැනැත්තාට අවස්ථාව දෙන අතරම තමන් වෙත පුද්ගලයින් කැඳවීමට ද, ලේඛන හා වාර්තා ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද බලය තිබිය යුතුය.''

(5) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:—

"(5) විමර්ශනය සමාප්ත වූ විට එම විනිශ්චයාධිකාරය සිය සොයා ගැනීම් විශේෂ කාරක සභාව වෙත වාර්තා කළ යුතු අතර, විශේෂ කාරක සභාව එම සොයා ගැනීම් පිළිබඳව සාකච්ඡාවට භාජනය කොට, ඉදිරිපත් වූ සාක්ෂිවල කාර්යසටහන්ද සමගින්, සිය නිර්දේශයන්ද සහිත වාර්තාවක් එහි කාර්ය සැසි ආරම්භවීමෙන් මාසයක කාලයක් ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු අතර, පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කිරීමට සුදුසුයැයි තමන් සිතන යම් කාරණා සම්බන්ධයෙන් වූ විශේෂ වාර්තාවක් ඉදිරිපත් කිරීමටද එම කාරක සභාවට හැකිය.

එතෙකුදු වුවත්, මෙහි සඳහන් කාලය ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට විශේෂ කාරක සභාවට නොහැකි වේ නම්, තවදුරටත් විශේෂිත කාල සීමාවක් සඳහා හේතු දක්වමින් එසේ කාල සීමාව දීර්ඝ කරන ලෙස පාර්ලිමේන්තුවේ අවසරය ඉල්ලා සිටිය යුතු අතර, අවශ්‍යයැයි හැඟී යන පරිද්දෙන් එවැනි කාලය දීර්ඝ කිරීමක් ලබා දීමට පාර්ලිමේන්තුවට හැකි වන්නේය.''.

(6) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:—

"(6) විනිශ්චයාධිකාරයේ වාර්තාවේ සඳහන් සලකා බැලීම් සහ විශේෂ කාරක සභාවේ නිර්දේශ අනුව ඔප්පු වී ඇති විෂම පැවැත්මක් හෝ අබලතාවක් ඇති බවට සනාථ වූ තැනැත්තෙකු එම ධුරයෙන් ඉවත් කරනු ලැබීම සඳහා ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් සම්බන්ධයෙන් වූ යෝජනා සම්මතයක් සඳහා පාර්ලිමේන්තුවට ඡන්දය භාවිතා කළ හැකි වන අතර එවැනි යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුවේ සම්මත වූ කල්හි,

කථානායකවරයා විසින් පාර්ලිමේන්තුව වෙනුවෙන් එම යෝජනාව ජනාධිපතිවරයාට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේය.''.

6. 104 සිට 115 දක්වා ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:—

**''උපදේශක කාරක සභා**

104. ආණ්ඩුවේ යම් යම් කටයුතුවලට අදාළ අමාත්‍යාංශ එකක් හෝ වැඩි ගණනක් සඳහා පාර්ලිමේන්තු උපදේශක කාරක සභා පත් කළ හැකිය. පනත් කෙටුම්පත්, නීති සම්පාදනය සඳහා යෝජනා, පරිපූරක හෝ අනෙකුත් ඇස්තමේන්තු, වියදම් ප්‍රකාශ, යෝජනා, වාර්ෂික වාර්තා හෝ ලේඛන ආදී අමාත්‍යාංශවලට අදාළ සියලුම කාරණාවලට සම්බන්ධ කටයුතු පිළිබඳ විමර්ශනය කිරීම සහ වාර්තා කිරීම ඒවායේ රාජකාරිවලට ඇතුළත් වේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහ අමාත්‍යාංශවල ඔවුන්ගේ නිලධාරීන් මගින් අමාත්‍යවරු සිදුකරවාගත යුතුයැයි බලාපොරොත්තු වන කාරණාවලට අදාළ කටයුතු මෙහිදී සැලකිල්ලට නොගත යුතුය. අදාළ අමාත්‍යවරයාගේ උපදෙස් සහිතව ඕනෑම පනත් කෙටුම්පතක් හෝ යෝජනාවක් සඳහා මුල පිරීමේ බලය උපදේශක කාරක සභාවකට තිබිය යුතුය.

105. ඉහත සඳහන් කාර්යයන් සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු වීම සහතික කරලනු වස්, අවශ්‍ය උපදේශක කාරක සභා සංඛ්‍යාව සෑම පාර්ලිමේන්තු සැසිවාරයක් ආරම්භයේදීම තේරීම් කාරක සභාව විසින් තීරණය කර එම පත්කිරීම් සිදුකරනු ලැබිය යුතුය. විශේෂයෙන්ම පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය කිරීම සඳහා කාරක සභා පත් කරනු ලැබිය යුතු අතර එම කාරක සභාවල විෂය පථය යටතේ එම ක්ෂේත්‍රවලට වගකියන සියලුම අමාත්‍යාංශවලට අදාළ කාරණා සාකච්ඡා කරනු ලැබිය යුතුය:—

1. රාජ්‍ය ආරක්ෂාව
2. විදේශ කටයුතු
3. ආර්ථික සංවර්ධනය
4. අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය
5. රාජ්‍ය පරිපාලන සහ පළාත් පාලන
6. අධිකරණ
7. මුදල්
8. සෞඛ්‍යය
9. ප්‍රවාහන සහ මහාමාර්ග
10. පරිසරය සහ ආපදා කළමනාකරණ
11. වාරිමාර්ග සහ ජල කළමනාකරණ
12. කෘෂිකර්ම, ධීවර සහ පශු සම්පත් සංවර්ධන
13. කර්මාන්ත
14. මානව අයිතිවාසිකම් සහ ප්‍රතිසන්ධානය
15. ගුවන් සේවා සහ නාවික

16. බලශක්ති, ඛනිජ තෙල් සහ ඛනිජ සම්පත්
17. පුරාවිද්‍යා, ජාතික උරුමයන් සහ සංස්කෘතික කටයුතු
18. ජනමාධ්‍ය
19. තැපැල් සහ විදුලි සංදේශ
20. කම්කරු
21. වෙළෙඳ සහ සමූපකාර
22. ඉඩම් සහ නාගරික සංවර්ධන

තේරීම් කාරක සභාව විසින් අනෙකුත් උපදේශක කාරක සභා පත්කළ හැකි අතර වාර්ෂිකව එම කාරක සභාවල වාර්තා නැවත අලුත් කිරීම සහ එම කාරක සභාවල සංයුතිය අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදු කරනු ලැබිය හැකිය.

106.

එක් එක් කාරක සභාව යටතේ එන විෂයයන් භාර අමාත්‍යවරයාගේ හෝ අමාත්‍යවරයන්ගේ අදහස් විමසීමෙන් අනතුරුව තේරීම් කාරක සභාව විසින් ඒ ඒ උපදේශක කාරක සභාවේ සභාපතිවරයන් පත් කරනු ලැබිය යුතුය. අමාත්‍යවරයන් හෝ නියෝජ්‍ය අමාත්‍යවරයන් උපදේශක කාරක සභාවල සභාපතිවරයන් නොවිය යුතු අතර එකී කාරක සභාවන්ගෙන් අවම වශයෙන් හරි අඩකවත් සභාපතිවරයන් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයන් විය යුතුය. උපදේශක කාරක සභාවේ ගණපූරණය සභික මන්ත්‍රීවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. ගණපූරණය නොමැති අවස්ථාවකදීත් සාකච්ඡා පැවැත්විය හැකි වුවද, ගණපූරණය සහිත කාරක සභා රැස්වීමකදී අනුමත වුවහොත් මිස එවන් සාකච්ඡා කාරක සභාවේ නිල කටයුතුවල කොටසක් නොවිය යුතුය.

107.

සෑම උපදේශක කාරක සභාවක්ම පස් දෙනෙකුට නොඅඩු හා පහළොස් දෙනෙකුට නොවැඩි සභික මන්ත්‍රීවරයන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු අතර එම සභික මන්ත්‍රීවරයන් තේරීම් කාරක සභාව විසින් පත් කරනු ලැබිය යුතුය. කිසිදු මන්ත්‍රීවරයෙකු උපදේශක කාරක සභා තුනකට වැඩි සංඛ්‍යාවකට අයත් නොවිය යුතු නමුත් (පහත අංක 108 ස්ථාවර නියෝගයේ අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා හැර) තමන් සභිකයෙකු නොවන උපදේශක කාරක සභාවක රැස්වීමකට සහභාගී වීමට ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට ඉඩකඩ තිබිය යුතුය. එසේවුවද, එම කාරක සභාවේ සභාපතිවරයා ඉල්ලා සිටි විට එම මන්ත්‍රීවරයා එම ස්ථානයෙන් ඉවත් විය යුතුය.

108.

සෑම උපදේශක කාරක සභාවක් තුළම යටත් පිරිසෙයින් පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන සෑම පක්ෂයකින්ම එක් සභික මන්ත්‍රීවරයෙකු හෝ සිටිය යුතු අතර හැකි සෑම අවස්ථාවකදීම ඒවා පාර්ලිමේන්තුවේ පක්ෂ සංයුතිය නිරූපනය කරන ආකාරයෙන් විය යුතුය. කාරක සභා පහක සේවය කිරීම සඳහා අයදුම් කරන මන්ත්‍රීවරයන්ගේ මනාපය මත පදනම්ව තේරීම් කාරක සභාව විසින් උපදේශක කාරක සභා සඳහා පත්වීම් සිදු කරනු ලැබිය යුතුය.

109.

සෑම කාරක සභාවක්ම යටත් පිරිසෙයින් මාසයකට වරක්වත් රැස්විය යුතු අතර විශේෂ වැදගත්කමක් සහිත කරුණු කාරක සභාවේ අනු කාරක සභා මගින් සාකච්ඡා කිරීම සඳහා අවකාශය අමාත්‍යවරයා හෝ

අමාත්‍යවරයන් විසින් සලසා දෙනු ලැබිය යුතුය. එවැනි සාකච්ඡා අමාත්‍යාංශයේදී පැවැත්විය යුතු අතර එම කාර්යය සඳහා වන අනු කාරක සභාවක්, අදාළ උපදේශක කාරක සභාව නියෝජනය කරනු ලබන සෑම පක්ෂයක්ම නියෝජනය වන පරිදි සභාපතිවරයා විසින් නම් කරනු ලැබිය යුතුය.

110.

යෝජනා කරනු ලබන්නාවූ පනත් කෙටුම්පත් හි විෂයයන් භාර අමාත්‍යවරයන් විසින් එම සියලුම පනත් කෙටුම්පත් අදාළ උපදේශක කාරක සභාවේ නිරීක්ෂණ සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර එම පනත් කෙටුම්පත් සාකච්ඡාවට භාජනය කෙරෙන විශේෂ රැස්වීම්වල මූලාසනය දරනු ලැබිය යුතුය.

111.

උපදේශක කාරක සභාවේ සභික මන්ත්‍රීවරයෙකු මියගියහොත්, ඉල්ලා අස්වුවහොත් හෝ සාමාජිකත්වය හැර ගිය අවස්ථාවක එම සභික මන්ත්‍රීවරයා වෙනුවට උපදේශක කාරක සභාවට වෙනත් මන්ත්‍රීවරයකු තේරීම් කාරක සභාව විසින් පත් කරනු ලැබිය හැකිය. කාරක සභාව අවශ්‍යයැයි තීරණය කරනු ලැබූ විටෙක ඕනෑම සභික මන්ත්‍රීවරයෙකු ඕනෑම උපදේශක කාරක සභාවකින් ඉවත් කොට ඒ වෙනුවට වෙනත් මන්ත්‍රීවරයකු පත්කිරීමට තේරීම් කාරක සභාවට බලය ඇත්තේය. මෙම නියෝගය යටතේ සෑම පත්කිරීමක්ම ඊළඟ පාර්ලිමේන්තු සභාවාරයේදී නිවේදනය කරනු ලැබිය යුතුය.

112.

යම් සභික මන්ත්‍රීවරයෙකු ස්වකීය අත්සනින් යුතු අයදුම්පත්‍රයක් කාරක සභාව වෙත ඉදිරිපත් කරමින් කාරක සභාවේ පූර්ව අනුමතිය ලබා නොගෙන පිට පිටම රැස්වීම් තුනකට නොපැමිණියහොත් ඔහු එකී කාරක සභාවේ දැරූ සභිකත්වය අත්හැර ගියා සේ සැලකිය යුතු අතර තේරීම් කාරක සභාව එකඟ නොවන්නේ නම් එම සැසිවාරය තුළ එකී කාරක සභාවට නැවත පත් නොකළ යුත්තේය:

එතෙකුදු වුවත්, සභික මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තුවේ පූර්ව අවසරය ලබා ගෙන පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගී නොවී සිටින කාල සීමාව තුළ යම් දිනයක එකී කාරක සභාවේ රැස්වීම් පැවැත්වෙන්නේ නම් ඉහත සඳහන් විධිවිධාන අදාළ නොවන්නේය.

113.

උපදේශක කාරක සභාවේ සභාපතිවරයා හා අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අදහස් විමසමින් උපදේශක කාරක සභාවේ රැස්වීම් යටත් පිරිසෙයින් මාසයකට වරක්වත් කැඳවන බවටත්, ඵලදායි වැඩසටහන් සකස් කර ගන්නා බවටත් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් වගබලා ගත යුතුය. අදාළ සෑම අමාත්‍යාංශයකම ලේකම්වරයා හෝ ඔහු නියෝජනය කරනු ලබන අතිරේක ලේකම්වරයකු උපදේශක කාරක සභාවේ සෑම රැස්වීමකටම සහභාගී විය යුතු අතර එවැනි රැස්වීමකදී ඉල්ලා සිටිනු ලබන තොරතුරු හා වාර්තා එකී රැස්වීමෙන් සතියක කාලයක් ඇතුළත සපයා දීමටත් වගබලා ගත යුතුය.

යම් උපදේශක කාරක සභාවක යටතේ පිරිසෙයින් සභික මන්ත්‍රීන් තිදෙනෙකු විසින් ලිඛිත ඉල්ලීමක් කරනු ලැබුවහොත් එම උපදේශක කාරක සභාවේ රැස්වීම් හැකි ඉක්මනින් කැඳවනු ලැබිය යුතුය.

114.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් ඕනෑම නිලධාරියෙකු එකී සෑම කාරක සභාවකම ලේකම්වරයා ලෙස කටයුතු කළ යුතුය. ඔහුගේ වගකීම් හා කාර්යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය, පහසුකම් හා සම්පත් අවශ්‍ය පරිදි ඔහු වෙත සපයා දිය යුතුය. රැස්වීම් පැවැත්වීමෙන් සතියක කාලයක් ඇතුළත රැස්වීම්වල කාර්ය සටහන් සකස් කිරීම හා කාරක සභාවේ මීළඟ රැස්වීමේදී අනුමත කර ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට පෙරාතුව පැහැදිලි කර ගැනීම හා අනුමතිය සඳහා එකී කාර්ය සටහන්වල පිටපත් සභාපතිවරයාට, අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාට හා අදාළ අමාත්‍යවරයා වෙත ලබාදීම එම වගකීම් හා කාර්යයන්වලට ඇතුළත් වන්නේය.

115.

එක් එක් අමාත්‍යාංශයට අදාළ සෑම වාර්තාවක්ම උපදේශක කාරක සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. ඊට අතිරේක වශයෙන්, පාර්ලිමේන්තුව විසින් උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද කරුණක් සම්බන්ධයෙන් ඕනෑම වාර්තාවක්, එවැනි යොමු කිරීමකින් මාස තුනක කාලසීමාවක් ඇතුළත සභාපතිවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර, පාර්ලිමේන්තුව විසින් අවශ්‍යයැයි සලකන්නේ නම් එහි ඕනෑම කොටසක් තවදුරටත් සලකා බැලීමට යෝජනා කරනු ලැබිය හැකිය. කාරක සභාවක යම් සභික මන්ත්‍රීවරයෙකුගේ වෙනත් මතයක් ඇතොත් එයද වාර්තාවට ඇතුළත් කළ යුතුය:

එසේකුදු වුවත්, අදාළ කරුණු සම්බන්ධව උපදේශක කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන තෙක්, උපදේශක කාරක සභාවට යොමු කරන ලද කරුණු පාර්ලිමේන්තුව විසින් සලකාබැලීම සඳහා නොගත යුතුය.

යම් යම් පුද්ගලයන් කැඳවීමට, ලිපි ලේඛනාදිය හා වාර්තා ගෙන්වා ගැනීමට හා පරීක්ෂා කිරීමට, උපදේශක කාරක සභාව වෙත යොමු කොට ඇති හෝ එහි විෂයය පථය යටතේ ගැනෙන කරුණක් පූර්ණ වශයෙන් සලකා බැලීම සඳහා ස්ථානයෙන් ස්ථානයට යාම හෝ වෙනත් අදාළ ක්‍රියාකාරකම් සිදුකිරීමට සහ පාර්ලිමේන්තුව කල්තබා තිබියදී වුවද රැස්වීමට, කාරක සභාවට බලය තිබිය යුත්තේය:

එසේම, අදාළ අමාත්‍යවරයාගේ තීරණය ප්‍රකාර, එවැනි පුද්ගලයින් කැඳවීමට, ලිපිලේඛනාදිය හා වාර්තා ගෙන්වා ගැනීමට නොහැකි වුවහොත් අමාත්‍යවරයා විසින් එය ලිඛිතව පැහැදිලි කරනු ලැබිය යුතු අතර අදාළ කරුණ අමාත්‍යවරයා සමග සාකච්ඡා කිරීමට කාරක සභාවට අවස්ථාව ලබා දිය යුතුය.”

7.

අංක 125 (1) ස්ථාවර නියෝගයේ අගට පහත කොටස ඇතුළත් කරන්න:—

“මුදල් විෂයය භාර අමාත්‍යවරයා සමග සාකච්ඡා කොට කථානායකවරයා විසින් පත්කරනු ලබන කාරක සභා සභාපතිවරයෙකු සහ නියෝජ්‍ය සභාපතිවරයෙකු සිටිය යුතුය. සභාපතිවරයා හෝ නියෝජ්‍ය සභාපතිවරයා, අමාත්‍යවරයෙකු හෝ ව්‍යාපෘති අමාත්‍යවරයෙකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු නොවිය යුතු අතර, සභාපතිවරයා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයෙකු ද නියෝජ්‍ය සභාපතිවරයා ආණ්ඩු පාර්ශ්වයේ මන්ත්‍රීවරයෙකු ද විය යුතුය.”

(6) ඡේදයට ඉක්බිතිවම පහත කොටස ඇතුළත් කරන්න:—

"(7) රජයේ ගිණුම් කාරක සභාව විසින් පහත සඳහන් කරුණු පිළිබඳ නිර්දේශයන් ඇතුළත් විය හැකි වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය:—

(i) ප්‍රතිපත්තීන්හි සිදු කරන වෙනස්කිරීම්

(ii) ආයතනික හෝ කළමනාකරණ ක්‍රියා පටිපාටීන්හි සිදුකරන වෙනස්කිරීම්

(iii) ව්‍යාපෘති හා වැඩසටහන් අත්හිටුවීම

(iv) නිලධාරීන්ට වගකීම් පැවරීම

(v) විනය ක්‍රියා පටිපාටි පැනවීම

(vi) අපරාධ වගකීමක් පිළිබඳව හෙළිදරවු වූ විට අදාළ බලධාරීන් වෙත යොමු කිරීම

වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කර මුදල් විෂය භාර අමාත්‍යවරයා වෙත යවනු ලබන අතර අමාත්‍යවරයා විසින් මාසයක් ඇතුළත වාර්තාවට ප්‍රතිචාර දක්වා, ක්‍රියාත්මක කිරීමට අදාළ කාල රාමුවක් ද සහිතව කවර නිර්දේශයන් පිළිගනු ලබන්නේද යන්න දක්වනු ලැබිය යුතුය. ක්‍රියාත්මක කළ නොහැකි නිර්දේශයන් සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සපයනු ලබන අතර, එලෙස මතුකරන ලද ගැටලු සම්බන්ධයෙන් ඒ වෙනුවට ගනු ලබන ප්‍රතිකර්මීය පියවර පිළිබඳ විස්තරයක්ද ඒ සමග සපයනු ලැබිය යුතුය.

එවැනි ප්‍රතිචාරයකින් පසුව වාර්තාව පාර්ලිමේන්තුව විසින් සාකච්ඡාවට භාජනය කරනු ලබන සංශෝධනවලින් අනතුරුව සුදුසු වේ යැයි සැලකේ නම්, අනුමත කරනු ලබන අතර, එවැනි වාර්තාවක ඇති නිර්දේශ ඒවා ක්‍රියාත්මක කර මාස හයක කාල පරිච්ඡේදයක් තුළ නැවත පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වගකිවයුතු ආණ්ඩුව වෙත කරනු ලබන නිර්දේශ ලෙස සලකනු ලැබිය යුතුය. එවැනි වාර්තා නිසි කලට ඉදිරිපත් කරන බවට කථානායකවරයා විසින් සහතික කරගනු ඇති අතර සිදුවන ප්‍රමාදයන් පිළිබඳව විධායකයේ ප්‍රධානියාට දැනුම්දෙනු ලැබිය යුතුය.

(8) සිය අත්සන සහිතව සිදු කරන අයැදුම් කිරීමක් මත එම කාරක සභාවේ පූර්ව අවසර ලබා නොගෙන කාරක සභාවේ අනුගාමී රැස්වීම් තුනකට සහභාගී නොවන ඕනෑම සභික මන්ත්‍රීවරයෙකු එම කාරක සභාවේ සිය සාමාජිකත්වය අතහැර ගියා සේ සලකනු ඇති අතර, තේරීම් කාරක සභාව විසින් එකඟ වුවහොත් හැර, එම සැසි වාරය තුළදී අදාළ කාරක සභාව සඳහා යළි පත් කරනු නොලැබිය යුතුය."

8.

අංක 126 (1) ස්ථාවර නියෝගයේ අගට පහත කොටස ඇතුළත් කරන්න:—

"මුදල් විෂය භාර අමාත්‍යවරයා සමග සාකච්ඡා කොට කථානායකවරයා විසින් පත්කරනු ලබන කාරක සභා සභාපතිවරයෙකු සහ නියෝජ්‍ය සභාපතිවරයෙකු සිටිය යුතුය. සභාපතිවරයා හෝ නියෝජ්‍ය සභාපතිවරයා, අමාත්‍යවරයෙකු හෝ ව්‍යාපෘති අමාත්‍යවරයෙකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු නොවිය යුතු අතර, සභාපතිවරයා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයෙකු ද නියෝජ්‍ය සභාපතිවරයා ආණ්ඩු පාර්ශ්වයේ මන්ත්‍රීවරයෙකු ද විය යුතුය."

(6) ඡේදයට ඉක්බිතිවම පහත කොටස් ඇතුළත් කරන්න:—

"(7) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පහත දැක්වෙන කරුණු පිළිබඳව නිර්දේශයන් ඇතුළත් විය හැකි වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කරනු ඇත.

(i) ප්‍රතිපත්තීන්හි සිදු කරන වෙනස්කිරීම්

(ii) ආයතනික හෝ කළමනාකරණ ක්‍රියා පටිපාටීන්හි සිදුකරන වෙනස්කිරීම්

(iii) ව්‍යාපෘති හා වැඩසටහන් අත්හිටුවීම

(iv) නිලධාරීන්ට වගකීම් පැවරීම

(v) විනය ක්‍රියා පටිපාටි පැනවීම

(vi) අපරාධ වගකීමක් පිළිබඳව හෙළිදරව් වූ විට අදාළ බලධාරීන් වෙත යොමු කිරීම

වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කොට මුදල් විෂය භාර අමාත්‍යවරයා වෙත යවනු ලබන අතර අමාත්‍යවරයා විසින් මාසයක් ඇතුළත වාර්තාවට ප්‍රතිචාර දක්වා, ක්‍රියාත්මක කිරීමට අදාළ කාල රාමුවක් ද සහිතව කුමන නිර්දේශයන් පිළිගනු ලබන්නේද යන්න දක්වනු ලැබිය යුතුය. ක්‍රියාත්මක කළ නොහැකි නිර්දේශයන් සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සපයනු ලබන අතර, එලෙස මතු කරන ලද ගැටලු සම්බන්ධයෙන් ඒ වෙනුවට ගනු ලබන ප්‍රතිකර්මීය පියවර පිළිබඳ විස්තරයක්ද ඒ සමග සපයනු ලැබිය යුතුය.

එවැනි ප්‍රතිචාරයකින් පසුව වාර්තාව පාර්ලිමේන්තුව විසින් සාකච්ඡාවට භාජනය කර, සංශෝධනවලින් අනතුරුව සුදුසු වේ යැයි සැලකේ නම්, අනුමත කරන අතර, එවැනි වාර්තාවක ඇති නිර්දේශ, ඒවා ක්‍රියාත්මක කර මාස හයක කාල පරිච්ඡේදයක් තුළ නැවත පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වගකිවයුතු ආණ්ඩුව වෙත කරනු ලබන නිර්දේශ ලෙස සලකනු ලැබිය යුතුය. එවැනි වාර්තා නිසි කලට ඉදිරිපත් කරන බවට කථානායකවරයා විසින් සහතික කරගනු ඇති අතර සිදුවන ප්‍රමාදයන් පිළිබඳව විධායකයේ ප්‍රධානියාට දැනුම්දෙනු ලැබිය යුතුය.

(8) සිය අත්සන සහිතව සිදු කරන අයදුම්කිරීමක් හරහා එම කාරක සභාවේ පූර්ව අවසර ලබා නොගෙන කාරක සභාවේ අනුගාමී රැස්වීම් තුනකට සහභාගී නොවන ඕනෑම සාමාජික මන්ත්‍රීවරයෙකු එම කාරක සභාවේ සිය සාමාජිකත්වය අතහැර ගියා සේ සලකනු ඇති අතර, තේරීම් කාරක සභාව විසින් එකඟ වුවහොත් හැර, එම සැසිවාරය තුළදී අදාළ කාරක සභාව සඳහා යළි පත් කරනු නොලැබිය යුතුය."

9.

අංක 128(5) ස්ථාවර නියෝගය අගට පහත කොටස ඇතුළත් කරන්න:—

"පාර්ලිමේන්තුවේදී සම්මතවූ වාර්තාව ඉන්පසුව විධායකයේ ප්‍රධානියා වෙත යවනු ලබන අතර, වාර්තාවේ මතුකර ඇති කරුණු සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වාර්තාවේ සටහන් කර ඇති අඩුපාඩු යළි සිදුවීම වැළැක්වීම සඳහා ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග පිළිබඳව මාස තුනක් ඇතුළත යළි වාර්තා කරනු ලැබිය යුතුය."

10.

අංක 128අ(3) සහ (4) ස්ථාවර නියෝග ඉවත් කර ඒවා වෙනුවට පහත කොටස ආදේශ කරන්න:—

"(3) කාරක සභාව විසින් විමර්ශනයට ලක්කරන ලද තැනැත්තන් පිළිබඳව සහ කාරක සභාවේ නිර්දේශ පිළිබඳ වාර්තාවක් සෑම කාර්තුවකදීම කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය. කාරක සභාවේ තීරණ පිළිබඳව ප්‍රශ්න ඇසීමට අවස්ථාව ලබා දීමෙන් පසු වාර්තාව පිළිගත යුතුය.

(4) කාරක සභාවේ ගණපූරණය සාමාජිකයින් හතර දෙනෙකු විය යුතු අතර පාර්ලිමේන්තුවේ සභා වාරය අවසන් කර තිබියදී පවා කාරක සභාවට එහි කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යා හැකිය.

(5) තම අත්සන යොදා ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රයක් මගින් කාරක සභාවේ පූර්ව අවසරය ලබා නොගෙන නොකඩවා කාරක සභාවේ රැස්වීම් වාර දෙකකට සහභාගී නොවන ඕනෑම සාමාජිකයෙකු එම කාරක සභාවේ සාමාජිකත්වය අතහැර ගියා සේ සලකනු ලබන අතර තේරීම් කාරක සභාව විසින් එකඟ නොවෙන්නේ නම්, එම සභාවාරය තුළදී නැවත වරක් එම කාරක සභාවේ සාමාජිකයෙකු ලෙස පත් නොකළ යුතුය.

(6) (2) ඡේදයේ සිට (5) ඡේදය දක්වා වූ විධිවිධානයන් පාර්ලිමේන්තු සභාවට ද අදාළ විය යුතුය:

එසේ වුවත් සාමාජිකයන් තම ධූරය දැරීමේ ප්‍රතිඵලයක් ලෙස සාමාජිකත්වය දරන අවස්ථාවලදී පහත සඳහන් පරිදි ඒ වෙනුවට වෙනත් අයෙකු විසින් සාමාජිකත්වයේ කටයුතු කරනු ලැබිය හැකිය:—

කථානායකවරයා වෙනුවට නියෝජ්‍ය කථානායකවරයා

අග්‍රාමාත්‍යවරයා වෙනුවට සභානායකවරයා

විරුද්ධ පාර්ශ්වයේ නායකයා වෙනුවට පාර්ලිමේන්තුවේ ඊළඟ වැඩිම නියෝජනය සහිත පක්ෂයේ නායකයා."

11\.

අංක 132 ස්ථාවර නියෝගයේ "රජයේ ගිණුම් කාරක සභාව" යන වචන යෙදෙන සෑම තැනකම "හෝ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව" යන වචන අදාළ පරිදි ඇතුළත් කරන්න.

*2.

ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1]

*4.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශ මත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.24 දින ඉදිරිපත් කරන ලද නියෝගය (විදුලිබල පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යපටිපාටි) අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*12.

අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ඉඩම් අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

15.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

19.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

20.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

21.

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---